ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்
THE NATIONAL FILM CORPORATION OF SRI LANKA
( Incorporated under Act.No.47 of 1971 )

2026-09-03

0112590761
NFC/115/03/02/01 (OIFF)- 2026

සියලුම විද්‍යුත් / මුද්‍රිත / සමාජ මාධ්‍ය
ආයතන ප්‍රධානීන් වෙත,

**99 වැනි ඇකඩමි (ඔස්කාර්) සිනමා සම්මාන උළෙල සඳහා ශ්‍රී ලංකා නිල නියෝජනය – මාධ්‍ය සාකච්ඡාව**

99 වැනි ඇකඩමි (ඔස්කාර්) සිනමා සම්මාන උළෙලේ ජාත්‍යන්තර දීර්ඝ වෘත්තාන්ත සිනමා කාණ්ඩය (International Feature Film) සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් චිත්‍රපටයක් නිල වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

02. ඒ අනුව, ජාතික චිත්‍රපට සංස්ථාවේ මැදිහත් වීමෙන් පිහිටුවන ලද සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ චිත්‍රපට කලා හා විද්‍යා ඇකඩමිය (Academy of Motion Picture Arts and Sciences) විසින් අනුමත කරන ලද තේරීම් කමිටුවක් මගින් ශ්‍රී ලංකාවේ නිල නියෝජිත චිත්‍රපටය තෝරා ගැනීමට නියමිතය.

03. ඔස්කාර් සිනමා සම්මාන උළෙලේ නීති හා රෙගුලාසිවලට අනුව අදාළ චිත්‍රපට ඉදිරිපත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම සහ ඒ සම්බන්ධයෙන් දේශීය වශයෙන් පුළුල් ප්‍රචාරණයක් සිදු කිරීම අවශ්‍ය වේ. එම ක්‍රියාවලිය සම්බන්ධයෙන් මාධ්‍ය ආයතන දැනුවත් කිරීම සඳහා 2026 සැප්තැම්බර් මස 11 වැනි දින පෙ.ව 10.00ට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරයේදී මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

04. මෙම මාධ්‍ය සාකච්ඡාව මගින් ශ්‍රී ලංකාවේ නිල නියෝජනය සඳහා චිත්‍රපට ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය, අයදුම්පත් කැඳවීම, අදාළ සුදුසුකම් සහ ඇකඩමි සිනමා සම්මාන උළෙලේ නීති හා රෙගුලාසි සම්බන්ධයෙන් මාධ්‍ය ආයතන දැනුවත් කිරීමට අපේක්ෂා කරන බැවින්, මෙම අවස්ථාව සඳහා ඔබගේ ආයතනයේ සහභාගීත්වය සහ මාධ්‍ය ආවරණය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

05. මෙම කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා ඔබ විසින් ලබා දෙන සහයෝගය අතිශයින් අගය කොට සලකමි.

ස්තුතියි.

සුදත් මහදිවුල්වැව
සභාපති
ජාතික චිත්‍රපට සංස්ථාව

**තැපැල් පෙට්ටිය අංකය 88, අංක 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව, කේබල් "චිත්‍ර සංස්ථා" කොළඹ.**
தபால் பெட்டி இல. 88, 303, பௌத்தாலோக மாவத்தை, கொழும்பு 7, இலங்கை கேபின் "ஸ்டேட்பிலிம்" கொழும்பு.
PO. BOX 88, No. 303, Bauddhaloka Mawatha, Colombo 07, Sri Lanka, Cables "State film" - Colombo - Fax No. 94 11 2585526
Email-filmcorp@sltnet.lk